# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 30 දරන ඇප පනත

---

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 28 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 10.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

## 1997 අංක 30 දරන ඇප පනත

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 28 වන දින.]

එල්.ඩී.–ඕ. 47/96.

**වරදක් සිදුකිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ වරදක් සිදුකර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තන් ඇප පිට නිදහස් කිරීම සඳහා ද අපේක්ෂිත ඇප දීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1997 අංක 30 දරන ඇප පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඩු නාමය.)

2. මේ පනතේ මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ව්‍යාතිරේකවලට යටත්ව, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අනුගම්‍ය ප්‍රතිපත්තිය විය යුත්තේ ඇප දීම රීතිය වශයෙන් සැලකීම සහ ඇප දීම ප්‍රතික්ෂේප කිරීම ව්‍යාතිරේකයක් ලෙස සැලකීමයි. (මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී ඇප දීම මාර්ගෝපදේශක ප්‍රතිපත්තිය විය යුතු බව.)

3. (1) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ හෝ මහජන ආරක්ෂක පනත යටතේ වූ නියෝග යටතේ හෝ වරදක් සිදු කර ඇති බවට හෝ වරදකට වරදකරු වී ඇති බවට චෝදනා ලැබ සිටින හෝ සැක කරනු ලබන තැනැත්තන් ඇප පිට නිදහස් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශිත විධිවිධාන සලසා ඇත්තේ යම් ලිඛිත නීතියක් යටතේ ද එම ලිඛිත නීතිය යටතේ හෝ වරදක් සිදු කර ඇති බවට හෝ වරදකට වරදකරු වී ඇති බවට චෝදනා ලැබ සිටින හෝ සැක කරනු ලබන තැනැත්තකුට මේ පනතේ සඳහන් කිසිවක් අදාළ නොවේ. (යම් නීති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ නොවන බව.)

(2) ඇප සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානයකට සඳහනක් වෙනත් යම් ලිඛිත නීතියක කර ඇති අවස්ථාවක, එම සඳහන් කිරීම මෙම පනත ක්‍රියාත්මක වන දින සිට බලපවත්වන පරිදි, මේ පනතේ අනුරූප විධිවිධානවලට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

4. ඇප දිය හැකි වරදක්, සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු, මෙහි මින් මතු සලසා ඇති විධිවිධාන වලට යටත්ව, ඇප මත මුදා හරිනු ලැබීමට හිමිකම් ඇත. (ඇප දිය හැකි වරදක් සිදුකරන හෝ සිදුකිරීමට සම්බන්ධ තැනැත්තන් ඇප මත නිදහස් කළ යුතු බව.)

ඇප දිය නොහැකි වරදක් සිදු කරන හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වන තැනැත්තන් අධිකරණයේ අභිමතය පරිදි නිදහස් කළ යුතු බව.

5. 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඇප දිය නොහැකි වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු අධිකරණයේ අභිමතය පරිදි මුදා හරිනු ලැබිය හැකි ය.

ඇප දිය හැකි වරදක් පොලිසිය මගින් විමර්ශනය කරනු ලබන විට තැනැත්තන් නිදහස් කිරීම.

6. (1) පොලිසිය මගින් විමර්ශනය කරනු ලබන වරදක් ඇප දිය හැකි වරදක් වන අවස්ථාවක දී, පොලිස් ස්ථානය භාර නිලධරයා භාරයේ සිටින සැකකරු එම වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස එම ස්ථාන භාර නිලධරයාට නියම කරනු නොලැබිය යුතු නමුත් එම සැකකරු අත්අඩංගුවට ගෙන පැය විසිහතරක් ගතවීමට පෙර, එම නිලධරයා විසින් ලිඛිත පොරොන්දුවක් මත එම සැකකරු මුදා හැර, නියම කරනු ලබන දිනයක දී මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් වන ලෙස එම සැකකරුට නියම කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, විමර්ශනයට පාත්‍රව ඇති, සිදු කරන ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විය හැකි මහජන ප්‍රතිචාරය මගින් සාමය කඩවීමක් ඇති වීමට ඉඩ ඇති බව ස්ථාන භාර නිලධරයාගේ මතය වන අවස්ථාවක, එම ස්ථාන භාර නිලධරයා විසින් අත්අඩංගුවේ සිටින සැකකරු එම වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින් උචිත යයි සලකනු ලබන පරිදි 7 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලිඛිත පොරොන්දුවක් දී පොලිස් ස්ථානයක ස්ථාන භාර නිලධරයකු විසින් නිදහස් කරනු ලැබ නියමිත දිනයේ දී මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් වීමට අපොහොසත් වන සැකකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා වූ බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින් තම

අභිමතය පරිදි නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව එම සැකකරු අවස්ථාවෝචිත පරිදි ඇප මත මුදා හැරීම සඳහා හෝ රිමාන්ඩ් භාරයට පත් කිරීම සඳහා හෝ ආඥා කරනු ලැබිය යුතු ය.

7. (1) ඇප දිය හැකි හෝ ඇප දිය නොහැකි වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ එවැනි වරදක් සිදු කර ඇති බවට හෝ සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින යම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ පෙනී සිටි විට හෝ ඒ අධිකරණය වෙත ගෙන එනු ලැබූ විට හෝ ඒ අධිකරණයට යටත් වූ විට–

ඇප දිය හැකි හෝ ඇප දිය නොහැකි වරදක් පිළිබඳව සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තන් ඇප මත නිදහස් කරනු ලැබිය හැකි ආකාරය.

(අ) අවශ්‍ය වූ විට අධිකරණයේ පෙනී සිටීම සඳහා එම තැනැත්තා විසින් දෙන ලද පොරොන්දුවක් මත :

(ආ) එම තැනැත්තා විසින් ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත :

(ඇ) ඇපකරුවන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් සමග එම තැනැත්තා විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කිරීම මත :

(ඈ) අධිකරණය විසින් සාධාරණ යැයි තීරණය කරනු ලබන මුදලක් එම තැනැත්තා විසින් තැන්පත් කිරීම මත : හෝ

(ඉ) අධිකරණය විසින් ආඥා කරනු ලබන යම් විස්තරයකට අයත් සාධාරණ සහතික ඇපයක් එම තැනැත්තා විසින් ඉදිරිපත් කිරීම මත

අධිකරණය විසින් එම තැනැත්තා මුදා හරිනු ලැබිය හැකි ය :

එසේ වුවද ඒ තැනැත්තා සිතාසි මත අධිකරණයේ පෙනී සිට නිදහස් කරන ලෙස ආඥා කරනු ලැබූ අවස්ථාවක දී, අධිකරණය විසින් වාර්තාගත කළ යුතු හේතු මත අධිකරණය විසින් අන්‍යාකාර ආඥාවක් කළහොත් මිස, එම තැනැත්තා විසින් ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත හෝ අවශ්‍ය වූ විට හෝ පෙනී සිටින බවට එම තැනැත්තා විසින් දෙනු ලබන පොරොන්දුවක් මත හෝ ඒ තැනැත්තා මුදා හැරිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ යම් තැනැත්තකුට බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස නියම කරනු ලැබූ අවස්ථාවක දී, එම බැඳුම්කරය ලියා අත්සන් කිරීම වෙනුවට, උචිත බැංකුවක ඇති අධිකරණයේ ගිණුමේ බැරට යම් මුදලක් තැන්පත් කිරීමට අධිකරණය විසින් එම තැනැත්තාට අවසර දෙනු ලැබිය හැකි ය.

(3) ඇපකරුවන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් සහිතව යම් තැනැත්තෙක් (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ බැඳුම්කරයක් ලියා අත්සන් කිරීම මත මුදා හරිනු ලැබූ අවස්ථාවක දී එම තැනැත්තා බැඳුම්කරයේ සඳහන් වේලාවට සහ ස්ථානයට පැමිණිය යුතු අතර අන්‍යාකාරයකට විධාන කරනු ලබන තුරු, දිගටම එසේ පැමිණිය යුතු ය.

අත්අඩංගුවෙන් නිදහස් කිරීම.

8. 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබූ විගස ම එය ලියා අත්සන් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ පෙනී සිටීම සඳහා ද එම තැනැත්තා අධිකරණය විසින් මුදා හරිනු ලැබිය යුතු අතර ඔහු බන්ධනාගාරයේ සිටීනම් ඇප පිට ඔහු මුදා හරින අධිකරණය විසින් බන්ධනාගාරය භාර නිලධරයා වෙත මුදා හැරීමේ ආඥාවක් නිකුත් කළ යුතු ය. ආඥාව ලැබීමේ දී එම බන්ධනාගාර භාර නිලධරයා විසින් එම තැනැත්තා මුදා හරිනු ලැබිය යුතු ය.

මුලින් තබන ලද ඇප ප්‍රමාණවත් නොවන විට ප්‍රමාණවත් ඇප තබන ලෙස ආඥා කිරීමට ඇති බලය.

9. වැරදීමකින්, වංචාවකින් හෝ අන්‍යාකාරයකින් ප්‍රමාණවත් නොවන ඇපකරුවන් භාරගනු ලැබූ විට නැතහොත් පසුව එම ඇපකරුවන් ප්‍රමාණවත් නොවන බවට පත්වුවහොත් ඇප පිට මුදාහරිනු ලැබූ තැනැත්තා අධිකරණය ඉදිරියට පමුණුවන ලෙස විධාන කරමින් අධිකරණය විසින් සිරභාරයට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එසේ පැමිණි විට ප්‍රමාණවත් ඇපකරුවන් ඉදිරිපත් කරන ලෙස ඔහුට ආඥා කළ හැකි ය: තවද එසේ කිරීමට ඒ තැනැත්තා අපොහොසත් වුවහොත් අධිකරණය විසින් ඔහු බන්ධනාගාරගත කරනු ලැබිය හැකි ය.

යම් තැනැත්තකු ප්‍රමාණවත් ඇපකරුවකු ද යන්න තීරණය කිරීම.

10. 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා යම් තැනැත්තකු ප්‍රමාණවත් ඇපකරුවකු ද යන්න තීරණය කිරීමේ දී, බැඳුම්කරය ප්‍රකාරව, සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තා අධිකරණය වෙත ගෙන්වා ගැනීමට එම තැනැත්තාට හැකිවේ ද යන ප්‍රශ්නය අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

බැඳුම්කරයේ ප්‍රමාණය.

11. (1) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ), (ඇ) හෝ (ඉ) ඡේද යටතේ යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි ලියා අත්සන් කළ යුතු බැඳුම්කරයක ප්‍රමාණය හෝ තැන්පත් කළ යුතු මුදල් ප්‍රමාණය හෝ ඉදිරිපත් කළ යුතු සහතික ඇපවල ප්‍රමාණය හෝ තීරණය කිරීමට යම් අධිකරණයකට අවශ්‍ය වී ඇති අවස්ථාවක දී, සැකකරු හෝ චූදිතයා විසින් සිදු කර ඇති

බවට චෝදනා කරනු ලබන වරදේ ස්වභාවය ද ඒ සඳහා නීතිය මගින් නිශ්චය කර ඇති දඬුවම ද එම සැකකරු හෝ චූදිතයාගේ ආදායම් තත්ත්වය ද නිසි ලෙස සැලකිල්ලට ගෙන අධිකරණය විසින් එසේ තීරණය කළ යුතු අතර, එසේ තීරණය කරනු ලබන මුදල අධිකතර මුදලක් නොවිය යුතු ය.

(2) අධිකරණය විසින් තීරණය කරනු ලැබූ මුදලක් සඳහා වූ බැඳුම්කරයක් තමා විසින් ම හෝ ඇපකරුවකු විසින් ලියා අත්සන් නොකොට තිබීමේ හේතුව මත හෝ තැන්පත් කිරීමට නියමිත මුදල තැන්පත් කරනු ලැබ නොමැතිවීමේ හේතුව මත හෝ ඉදිරිපත් කිරීමට නියමිත සහතික ඇපය ඉදිරිපත් කරනු ලැබ නොමැතිවීමේ හේතුව මත හෝ යම් සැකකරුවකු හෝ චූදිතයකු මුදා හරිනු නොලැබ ඇත්තේ නම් එම සැකකරු හෝ චූදිතයා අත්අඩංගුවේ සිටින කවර හෝ අවස්ථාවක දී එසේ තීරණය කරන ලද මුදල අධිකරණය විසින් අඩු කරනු ලැබිය හැකි ය.

මුදාහරිනු ලැබූ තැනැත්තා වෙත දැන්වීම් හෝ අධිකරණ විධාන භාරදිය හැකි ලිපිනය ඔහු විසින් සැපයිය යුතු බව.

12. (1) යම් තැනැත්තකු ඇප පිට මුදා හරිනු ලැබූ අවස්ථාවක දී, එම තැනැත්තා වෙත සියලු දැන්වීම් හෝ අධිකරණ විධාන භාර දිය හැකි ලිපිනයක් එම තැනැත්තා විසින් අධිකරණය වෙත හෝ ඇප භාර ගත් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පසු එම තැනැත්තා සොයා ගත නොහැකි වුවහොත් හෝ වෙනත් කුමන හෝ හේතුවක් මත ඔහු වෙත දැන්වීම් හෝ අධිකරණ විධාන භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි වුවහොත් එම ලිපිනය වෙත භාර කළ යම් දැන්වීමක් හෝ අධිකරණ විධානයක් එම තැනැත්තා වෙත නිසි පරිදි භාර දුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ස්වකීය දැනුම අනුව අසත්‍ය ලිපිනයක් යම් තැනැත්තකු විසින් දෙනු ලබන අවස්ථාවක දී, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා බරපතල වැඩ නැතිව බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් සියයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හැර, මරණ දඬුවම දිය හැකි වරදක් සඳහා ඇප නොදිය යුතු බව.

13. මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම දිය හැකි වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි හෝ සිදු කර ඇතැයි සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු, මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හැර, ඇප පිට මුදා හරිනු නොලැබිය යුතු ය.

අධිකරණය විසින් ඇප ප්‍රතික්ෂේප කිරීම සඳහා හෝ මුදා හැරීම පිණිස දැනට බලපවත්නා ආඥාවක් අවලංගු කිරීම සඳහා වූ හේතු.

**14.** (1) මේ පනතේ ඉහතින් ම වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුවද, ඇප දිය හැකි හෝ ඇප දිය නොහැකි වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇති බවට හෝ සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු නිසි අධිකරණ බලය ඇති අධිකරණය වෙත ඉදිරිපත් වූ විට හෝ එයට ගෙන එනු ලැබූ විට හෝ එයට යටත් වූ විට අධිකරණය විසින් එම තැනැත්තා ඇප පිට මුදාහැරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පොලිස් නිලධරයකු විසින් තත් කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත සහ අදාළ තැනැත්තා වෙත දැන්වීම් යවනු ලැබීමෙන් අනතුරුව එම තැනැත්තාගෙන් පෞද්ගලිකව ම හෝ ඔහුගේ නීතිඥවරයකු මගින් කරුණු විමසා එම තැනැත්තා ඇප පිට මුදාහැරීම සඳහා බලපවත්නා ආඥාව අවලංගු කිරීම–

(අ) එම තැනැත්තා–

(i) ඔහුගේ පරීක්ෂණයට හෝ නඩු විභාගයට පෙනී සිටීම සඳහා අධිකරණය වෙත නොපැමිණිය හැකි බවට ; හෝ

(ii) ඔහුට විරුද්ධව ඇති සාක්ෂිකරුවන් කෙරෙහි හෝ සාක්ෂිවලට අහිතකර ලෙස මැදිහත් විය හැකි බවට හෝ යුක්තිය ඉෂ්ටවීම කෙරෙහි අන්‍යාකාරයෙන් බාධා පැමිණවිය හැකි බවට : හෝ

(iii) ඇප පිට සිටින විට වරදක් සිදු කළ හැකි බවට : හෝ

(ආ) සිදු කර ඇති වරදේ බරපතලකම නිසා සහ එම වරද සඳහා වන මහජන ප්‍රතිචාරය නිසා මහජන කැළඹීමක් ඇති විය හැකි බවට

විශ්වාස කිරීමට අධිකරණයට හේතු ඇත්නම් අධිකරණය විසින් කළ හැකි ය.

(2) වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින යම් තැනැත්තකු ඇප පිට මුදා හැරීම (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී හෝ එම තැනැත්තා ඇප පිට මුදාහැරීම සඳහා බලපවත්නා ආඥාවක් අවලංගු කරන අවස්ථාවක දී, එම සැකකරු හෝ චූදිතයා අත්අඩංගුවේ රඳවා තබා ගැනීම සඳහා එම අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(3) තඩුවට අදාළ අවස්ථානුගත කරුණුවල වෙනසක් සිදු වී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් එම අධිකරණය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය ; නැතහොත් වෙනස් කරනු ලැබිය හැකි ය.

ඇප ලබාදීමට අදාළ ආඥාවක් ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම, පරිවර්තිත්ත කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් හේතු දිය යුතු බව.

15. වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින යම් තැනැත්තෙක් ඇප පිට මුදා හැරීම අධිකරණයක් විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී හෝ තැනැත්තකු ඇප පිට මුදා හැරීම සඳහා බලපවත්නා ආඥාවක් අවලංගු කරන අවස්ථාවක දී හෝ බලපවත්නා ආඥාවක් අවලංගු කරන ආඥාවක්, අවලංගු කරන හෝ වෙනස් කරන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි එම ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම, පරිවර්තිත්ත කිරීම හෝ වෙනස් කිරීම සඳහා වූ හේතු අධිකරණය විසින් ලිඛිතව සඳහන් කළ යුතු ය.

කිසිම තැනැත්තකු මාස දොළහකට වැඩි කාලයක් අත්අඩංගුවේ රඳවා තබා නොගත යුතු බව.

16. 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකරණයක් විසින් තැනැත්තකු වරදකරු කරනු ලැබ ඔහුට දණ්ඩන නියමයක් පනවනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු, ඔහු සිරභාරයට ගනු ලැබූ දින සිට මාස දොළහකට වැඩි කාලයක් සඳහා අත්අඩංගුවේ රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

රඳවා තබාගැනීමේ කාලසීමාව දීර්ඝ කළ හැක්කේ කෙසේද යන්න.

17. 16 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, අධිකරණයක් විසින් වරදකරු කරනු නොලැබූ සහ දණ්ඩන නියමයක් පනවනු නොලැබූ තැනැත්තකු මාස දොළහකට වැඩියෙන් වූ කාලයක් සඳහා අත්අඩංගුවේ රඳවා තබා ගැනීම සඳහා, තත් කාර්ය සඳහා නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත යම් කලාපයක පිහිටුවා ඇති මහාධිකරණයක් විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ මහාධිකරණයක් විසින්, වාර්තාගත කළ යුතු මනා සහ ප්‍රමාණවත් හේතු මත, ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුවද මේ වගන්තිය යටතේ ආඥා කරනු ලැබූ රඳවා තබා ගැනීමේ කාලසීමාව, කවර හෝ අවස්ථාවක දී එක් වරකට මාස තුනකට සහ මුළු එකතුව මාස දොළහකට වැඩි නොවිය යුතු ය.

ඇපකරුවන් නිදහස් කිරීම.

18. (1) ඇප පිට නිදහස් කරනු ලැබූ තැනැත්තකු අධිකරණයට පැමිණීම සහ අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් ඇපවී සිටින සියලු ම ඇපකරුවන් හෝ යම් ඇපකරුවකු විසින් කවර හෝ

අවස්ථාවක දී බැඳුම්කරයෙන් සම්පූර්ණයෙන් ම නිදහස් කිරීම සඳහා හෝ ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට අදාළ තාක් දුරට නිදහස් කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) එවැනි ඉල්ලීමක් කිරීමේ දී, නිදහස් කරනු ලැබූ තැනැත්තා අධිකරණය වෙත රැගෙන එන ලෙස විධාන කරමින් අධිකරණය විසින් සිරභාරයට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කළ යුතු ය.

(3) වරෙන්තුව ප්‍රකාරව එම තැනැත්තා අධිකරණයේ පෙනී සිටි විට හෝ සිය කැමැත්තෙන් භාර වූ විට සම්පූර්ණයෙන් ම හෝ ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට එය අදාළ වන තාක් දුරට බැඳුම්කරයෙන් නිදහස් කරන ලෙස අධිකරණය විසින් විධාන කළ හැකි අතර වෙනත් ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගන්නා ලෙස අධිකරණය විසින් එම තැනැත්තාට දැන්විය යුතු ය. ඔහු එසේ කිරීමට අපොහොසත් වුවහොත් අධිකරණය විසින් ඔහු අත්අඩංගුවට පත් කළ යුතු ය.

(4) තමා ඇපකරුවකු ලෙස ක්‍රියා කළේ යම් තැනැත්තකුගේ පැමිණ සිටීම හෝ පෙනී සිටීම සඳහා ද එම තැනැත්තා පැනගොස් සැඟවී සිටින්නේ නම් ඒ ඕනෑම අවස්ථාවක දී, එම ඇපකරු විසින් එම තැනැත්තා සිරභාරයට ගෙන වහාම අධිකරණය වෙත රැගෙන ආ යුතු අතර ඉන් පසු එම අධිකරණය විසින් ඇපකරුගේ බැඳුම්කරය නිදහස් කර වෙනත් ප්‍රමාණවත් ඇපකරුවකු සොයා ගන්නා ලෙස එම තැනැත්තාට දැනුම් දිය යුතු ය. එසේ කිරීමට ඔහු අපොහොසත් වුවහොත් අධිකරණය විසින් ඔහු අත්ඩංගුවට පත් කළ යුතු ය.

(5) ඇපකරු, ඇප නියම කරනු ලබන තැනැත්තන් සඳහා පුරුද්දක් ලෙස ඇපකරුවකු වශයෙන් ඉදිරිපත් වන තැනැත්තකු බව සහ ඔහු බැඳුම්කරයෙන් නිදහස් කරන ලෙස කර ඇති ඉල්ලීම ප්‍රමාණවත් හේතු නොමැතිව කරන ලද ඉල්ලීමක් බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් අධිකරණය විසින් එම ඇපකරුට රුපියල් එක්දහස් පන්සියයකට නොවැඩි දඩයක් පැනවීම හා එසේ ගෙවීම පැහැර හැරියහොත් මාස හයකට නොවැඩි කාලයක් සඳහා එම තැනැත්තාට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමක් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

19. (1) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද නිදොස් කිරීමකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී චූදිතයා සිරභාරයට ගෙන අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස විධාන කරමින් අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කළ හැකි අතර අභියාචනය විභාග කර අවසන් කරන තුරු ඔහු සිරභාරයේ තැබීම හෝ ඔහු ඇප පිට මුදාහැරීම හෝ ඒ අධිකරණය විසින් කළ හැකි ය.

ඇප ඉදිරිපත් කිරීම මත අභියාචක නිදහස් කළ යුතු බව.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද වරදකරු කිරීමකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය විසින්, වරදෙහි බරපතලකම සහ චූදිතයාගේ පූර්ව ක්‍රියාකලාපය සැලකිල්ලට ගෙන අභියාචක ඇප මත මුදා හැරීමට ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද වරදකරු කිරීමකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ, යම් මුදලකට සහ ඇපකරුවකු හෝ ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඒ අභියාචක ඇතුළත් වූ විට ඔහු ඇප පිට මුදා හරින ලෙස ආඥා කරනු ලැබූ අවස්ථාවක අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද එම අධිකරණය සුදුසු යයි කල්පනා කරන්නේ නම්, බැඳුම් ඔප්පුවකට ඇතුළත් වනු වෙනුවට, ප්‍රමාණවත් යයි ඒ අධිකරණය සලකන මුදලක් ඒ අධිකරණයෙහි තැන්පත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අභියාචක විසින් වෙනත් යම් ඇපයක් තබනු ලැබිය හැකි ය.

(4) අභියාචක එවැනි යම් බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට හෝ ඉහත කී පරිදි වෙනත් යම් ඇපයක් තැබූ විට හෝ ඔහු අත්අඩංගුවෙන් මුදා හරිනු ලැබිය යුතු ය.

(5) අභියාචක සිටින්නේ බන්ධනාගාරයේ නම් ඒ බන්ධනාගාරයේ අධිකාරීවරයා හෝ ජේලර්වරයා හෝ ඉදිරිපිට දී ඒ බැඳුම් ඔප්පුවට ඇතුළත් විය හැකි අතර, එසේ ඇතුළත් වූ විට, එය එම අභියාචනය ඉදිරිපත් කරන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය ඉදිරියේ දී ඇතුළත් වන ලද්දක් සේ සියලු ආකාරයෙන් ම වලංගු විය යුතු ය : තවද අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ සම්බන්ධයෙන් තැබිය යුතු ඇපයේ ප්‍රමාණය හා ස්වභාවය මේ කාර්යය සඳහා අධිකරණය විසින්, බන්ධනාගාරගත කිරීමේ වරෙන්තුවෙහි පිටසන් කළ යුතු ය.

(6) බරපතල වැඩ සහිතව යම් කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් නියම කරනු ලැබූ තැනැත්තකු අභියාචනයක් ඉදිරිපත් කොට ඇත්තා වූ ද එහෙත් නියමිත බැඳුම් ඔප්පුව

තැබීමට හෝ වෙනත් ඇපයක් දීමට හෝ ඔහුට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ කවර අධිකරණයක් වෙත ද ඒ අධිකරණයේ නඩු තීන්දුව බන්ධනාගාරයේ අධිකාරීවරයාට දැනුම් දෙන තුරු ඒ තැනැත්තා බරපතල වැඩ නැතිව අත්අඩංගුවෙහි රඳවා තබාගනු ලැබිය යුතු ය.

මහාධිකරණය විසින් අභියාචනය භාර ගැනීමේ දී ඇප පිට මුදා හැරීම.

20. (1) මහාධිකරණයක් විසින් කරන ලද නිදොස් කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, චූදිතයා සිර භාරයට ගෙන ඔහු අධිකරණය වෙත ගෙන එන ලෙස විධාන කරමින් මහාධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි අතර අභියාචනය විභාග කර අවසන් කරන තුරු ඔහු සිරභාරයේ තැබීම හෝ ඔහු ඇප පිට නිදහස් කිරීම හෝ ඒ අධිකරණය විසින් කළ හැකි ය.

(2) මහාධිකරණයක් විසින් වරදකරු කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අභියාචනය තීරණය කරනු ලබන තෙක්, මහාධිකරණය විසින් (3) වන උපවගන්තියට යටත්ව අභියාචක ඇප පිට නිදහස් කළ හැකි ය. ඇප පිට නිදහස් කරනු නොලැබූ අභියාචකයකුගේ අභියාචනය තීරණය කරනු ලබන තෙක් බන්ධනාගාර ආඥාපනත යටතේ සාදනු ලැබූ රීති මගින් නියමිත ආකාරයකට ඒ අභියාචක සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

(3) චූදිතයාට මරණීය දණ්ඩනය නියම කරනු ලැබූ අවස්ථාවක, දණ්ඩන නියමය ක්‍රියාවේ යෙදවීම නතර කොට, අභියාචනය තීරණය කරනු ලබන තෙක් ඔහු බන්ධනාගාරයෙහි රිමාන්ඩ් භාරයේ තබනු ලැබිය යුතු ය.

(4) ස්වකීය අභියාචනය තීරණය කරන තෙක් අභියාචකයකු ඇප පිට නිදහස් කරනු ලබන කාලසීමාව ද අභියාචක අත් අඩංගුවේ සිටී නම් (අභියාචනය ඉදිරිපත් කරනු ලබන අධිකරණය විසින් යම් අභියාචනයක්, සම්බන්ධයෙන් මීට පටහැනිව කරනු ලබන යම් විධානවලට යටත්ව) ඔහු අභියාචකයකු ලෙස මේ වගන්තිය යටතේ විශේෂයෙන් සලකනු ලබන කාලසීමාව ද ඔහුට නියම කර ඇති දණ්ඩන නියමය යටතේ බන්ධනාගාරගත කිරීමේ යම් කාලසීමාවක කොටසක් ලෙස සලකනු නොලැබිය යුතු ය;

තව ද මහාධිකරණය විසින් පනවන ලද දණ්ඩන නියමය යටතේ වුව ද අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් අධිකරණයක් වෙත ද එම අධිකරණය විසින් පනවන ලද දණ්ඩන නියමයක් යටතේ වුව ද, අභියාචක බන්ධනාගාරගත කිරීමක් අභියාචනා

ඉදිරිපත් කරනු ලැබූ අධිකරණයේ විධානවලට හෝ ආඥාවලට යටත්ව, අවස්ථාවට අවශ්‍ය පරිදි නැවත ආරම්භ වීම නැතහොත් පටන් ගැනීම, අභියාචක අත්අඩංගුවෙහි සිටී නම් අභියාචනය තීරණය කරනු ලැබූ දින සිට ද, අභියාචක අත්අඩංගුවෙහි නොසිටින්නේ නම් දණ්ඩන නියමය යටතේ ඔහු බන්ධනාගාරයට භාර ගනු ලැබූ දින සිට ද, සිදු වන ලෙස සලකනු ලැබිය යුතු ය.

**21.** (1) ඇප දිය නොහැකි වරදක් සිදු කර ඇති බවට හෝ තමා එවැනි වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සැක කිරීමේ හේතුව මත සිරභාරයට ගනු ලැබිය හැකි බවට විශ්වාස කිරීමට යම් තැනැත්තකුට හේතු ඇති අවස්ථාවක දී එම වරද සිදු කරනු ලැබූ බවට කියනු ලබන ප්‍රදේශයේ පිහිටි පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත දැන්වීමක් කර, තමා එම වරද සිදු කර ඇති බවට හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ වූ චෝදනාව මත තමා සිරභාරයට ගනු ලැබුවහොත්, ඇප පිට මුදා හරින ලෙස විධාන කරන ලෙස ඉල්ලමින් එම වරද සිදු කරනු ලැබූ බවට කියනු ලබන ප්‍රදේශය පිළිබඳ ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. අපේක්ෂිත ඇප.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් සමග ඉල්ලුම්කරු විසින් සාදන ලද දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද්දේ යම් අධිකරණයක් වෙත ද, ඒ අධිකරණය විසින් ඒ ඉල්ලීම ලැබුන වහාම ඒ ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් නියම කළ යුතු අතර, ඒ දිනය කවර හෝ විටක, ඉල්ලීම කරන ලද දිනයේ සිට දින හතකට වඩා වැඩි නොවිය යුතු ය : තවද ඒ දිනය පිළිබඳ දැන්වීම ඉල්ලුම්කරු වෙත ද, පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ද, යවනු ලැබිය යුතු ය.

(4) විභාගය සඳහා නියම කරන ලද දිනයේ දී, අධිකරණය විසින් ඉල්ලුම්කරුගෙන් පෞද්ගලිකව ම හෝ ඔහුගේ නීතිඥවරයා මාර්ගයෙන් ද පොලිස් ස්ථානය භාර නිලධරයා පැමිණ සිටී නම් ඔහුගෙන් ද කරුණු විමසීමෙන් පසු ඉල්ලීම පිළිබඳව වහාම ආඥාවක් කළ යුතු අතර, එම ආඥාව කිරීම සඳහා වූ හේතු වාර්තාගත කළ යුතු ය.

**22.** (1) ඉල්ලුම්කරු සිරභාරයට ගනු ලැබුවහොත්, ඔහු ඇප පිට මුදා හරිනු ලැබිය යුතු බවට වූ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන කවර හෝ අවස්ථාවක දී, (ඉල්ලුම්කරු ශ්‍රී ආඥාවට ඇතුළත් කළ යුතු කොන්දේසි.

ලංකාවෙන් බැහැරව යාම තහනම් කරන හෝ ඉල්ලුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රය අධිකරණයට භාර දිය යුතු බවට නියම කරන කොන්දේසි ද ඇතුළුව) අදාළ නඩුවේ සිද්ධිමය කරුණු සැලකිල්ලට ගැනීමේ දී සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් කොන්දේසි ද ආඥාවට ඇතුළත් කරනු ලැබිය යුතු අතර–

(අ) ආඥාව කරනු ලැබ ඇත්තේ යම් ඇප දිය නොහැකි වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් ද ඒ වරද හෝ වැරදි : සහ

(ආ) සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී ඉල්ලුම්කරු විසින් ඇප ඉදිරිපත් කළ යුතු ආකාරය

ඒ ආඥාවෙහි දක්වනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයකු විසින්, (2) වන වගන්තිය යටතේ ආඥාවක් කරමින් ඉල්ලුම්කරුට ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම තහනම් කරන විටක දී ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් එම කරුණ පිළිබඳව ආගමන හා විගමන පාලකවරයා වෙත වහාම දැනුම් දිය යුතු ය.

අපේක්ෂිත ඇප මත මුදාහරින ලද තැනැත්තකු ඉන්පසු සිරභාරයට ගනු ලැබීමේ බලපෑම්.

**23.** ඉල්ලුම්කරුවකු විසින් අයැද ඇති පරිදි වූ ආඥාවක් 21 වන වගන්තිය යටතේ කරනු ලැබීමේ දී සහ ආඥාවෙහි සඳහන් වරදක් සඳහා හෝ ආඥාවෙහි සඳහන් වරදක් සංයුක්ත වන ක්‍රියා මගින් සංයුක්ත වන වෙනත් යම් වරදක් සඳහා හෝ ඉන් පසුව ඉල්ලුම්කරු සිරභාරයට ගනු ලැබූ විට, ආඥාවෙහි සඳහන් ආකාරයට ඉල්ලුම්කරු විසින් ඇප ඉදිරිපත් කිරීමේ දී සහ ආඥාවෙහි යම් කොන්දේසි සඳහන්ව ඇත්නම්, ඒ කොන්දේසිවලට අනුව ඉල්ලුම්කරු ක්‍රියා කිරීමේ දී, වහාම ඇප පිට මුදා හරිනු ලැබීමට ඒ ඉල්ලුම්කරු හිමිකම් ලැබිය යුතු ය.

අපේක්ෂිත ඇප ලබා දිය හැකි වනුයේ යම් කොන්දේසි වලට යටත්ව ද එම කොන්දේසි.

**24.** 21 වන වගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවකට අනුව යම් තැනැත්තකු ඇප පිට මුදා හරිනු ලැබූ අවස්ථාවක දී, එම තැනැත්තා–

(අ) අවශ්‍ය කවර වූ හෝ අවස්ථාවක දී පොලිස් නිලධරයකු විසින් ප්‍රශ්න කරනු ලැබීම සඳහා ඉදිරිපත් විය යුතු ය. එසේ වුව ද එම ප්‍රශ්න කිරීම කවර හෝ අවස්ථානුගත කරුණක් නිසා සවස 6 සිට උදේ 6 දක්වා වූ කාල සීමාව තුළ සිදුකරනු නොලැබිය යුතු ය :

(ආ) නඩුවේ සිද්ධිමය කරුණු පිළිබඳව දැනුමක් ඇති යම් තැනැත්තකු අධිකරණය වෙත හෝ යම් පොලිස් නිලධරයකු වෙත එම සිද්ධිමය කරුණු හෙළිකිරීමෙන් එම තැනැත්තා වැළැක්වීම සඳහා එම තැනැත්තාට යම් පෙළඹවීමක්, තර්ජනයක් හෝ පොරොන්දුවක් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් නොකළ යුතු ය :

(ඇ) කෙළින් ම හෝ අන්‍යාකාරයකින් නඩුවේ යම් සාක්ෂි අපවේශනය කිරීම, හෝ යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලියෙහි ලා අන්‍යාකාරයකින් බාධා කිරීම, නොකළ යුතු ය.

21 වන වගන්තිය යටතේ ඉල්ලීමක් විභාගවෙමින් පවතින්නේ යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් ද ඒ ඉල්ලුම්කරු පොලිස් නිලධරයකු විසින් ප්‍රශ්න කළ හැකි බව හෝ වරෙන්තුවක් මත ඔහු සිරභාරයට ගනු ලැබිය හැකි බව.

**25.** 21 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් යම් අධිකරණයක් ඉදිරිපිට විභාග වෙමින් පැවතීමේ හේතුව නිසා 21 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගෙන් ප්‍රශ්න කිරීමට යම් පොලිස් නිලධරයකුට ඇති අයිතියට හෝ එවැනි යම් වරදක් සඳහා ඉල්ලුම්කරු සිරභාරයට ගැනීමේ වරෙන්තුවක් ලබා ගැනීම සඳහා එම අධිකරණය වෙත හෝ එම නඩුව සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති වෙනත් යම් අධිකරණයක් වෙත හෝ ඉල්ලුම් කිරීමට පොලිස් ස්ථාන භාර නිලධරයකුට ඇති අයිතියට හෝ වරෙන්තුවක් සඳහා කරන යම් ඉල්ලීමක් මත (රඳවා තබා ගැනීමේ ආඥාවක් ද ඇතුළුව) යම් ආඥාවක් කිරීමට එවැනි යම් අධිකරණයකට ඇති බලයට හෝ ඉන් හානියක් හෝ අගතියක් සිදු නොවිය යුතු ය.

අපේක්ෂිත ඇප මත මුදාහරිනු ලැබූ තැනැත්තන් අධිකරණයට පැමිණීම නියම කරන වරෙන්තු නිකුත් කිරීම.

**26.** (1) වරද විමර්ශනය කරන පොලිස් ස්ථානය භාර නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, 21 වන වගන්තිය යටතේ වූ ආඥාවක් කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ නඩුව සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු විසින්, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු හේතු මත ඒ ආඥාව කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ වාසියට ද, ඒ තැනැත්තා අධිකරණයට පැමිණිය යුතු බවට නියම කරමින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් කරනු ලැබ, එයට ප්‍රතිචාරයක් ලෙස ඉල්ලුම්කරු අධිකරණයේ පෙනී සිටි විට, ඇප සම්බන්ධයෙන් කලින් කරන ලද යම් විධානයක කුමක් සඳහන් වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, වාර්තාගත කළ යුතු හේතු මත, එම තැනැත්තා රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් උචිත යයි සලකනු ලබන ආඥාවක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු හේතු මත, ඕනෑම අවස්ථාවක එම ආඥාව අවලංගු කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

පරස්පරතාවක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු බව.

**27.** 1991 අංක 8 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත හැර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සහ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර ඒ අනුව, 1991 අංක 8 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත හැර, මේ පනතේ විධිවිධාන සහ ඒ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් පරස්පරතාවක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**29.** මේ පනතෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"ඇප දිය හැකි වරද" යන්නෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයේ 5 වන තීරයේ විස්තර කර ඇති වරදක් හෝ ඇප දිය හැකි වරදක් ලෙස වෙනත් යම් නීතියක් මගින් විස්තර කර ඇති වරදක් අදහස් වේ : සහ

"ඇප දිය නොහැකි වරද" යන්නෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයේ 5 වන තීරයේ විස්තර කර ඇති වරදක් හෝ ඇප දිය නොහැකි වරදක් ලෙස වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විස්තර කර ඇති වරදක් අදහස් වේ.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.